**"කිසිම දෙයක් ආපහු එපා.. මං මහපාරෙ හිටිය කාලෙ මගේ හෙවණැල්ල වගේ හිටිය ඔයාල වෙනුවෙන් යමක් කරන්න ලැබෙන එක මට සතුටක්.. මං ඔයාලෙගෙ ගෙදරින් බීල තියෙන තේ කෝප්ප ගානටවත් ගැලපෙන උදව්වක් කරන්න මට කවදාවත් ලැබෙන එකක් නැහැ.." ඔහු සුසුමක් හෙළණු ඇයට ඇසෙයි. ".. මට යමක් කරන්න පුලුවන් කාලෙ එනකොට ඔයාල මගෙන් ඈත් වුණා... ඒකයි මට දුක.."**

# ඇඩිසී

## ජගත් ජේ එදිරිසිංහ ලියයි




තොරතෝංචියක් නැතිව නාද වන දුරකතනය රණසිංහ නින්දෙන් පුබුදුවයි. නිදන්නට යන්නට පෙර එය නිවා නොදැමීම ගැන තමාටම සිතින් දොස් නගාගනිමින් ඔහු එය අතට ගනියි. දුරකතන මුහුණතේ දිස් වන්නේ අයේෂා ගේ දුරකතන අංකයයි. ඔහු දුරකතනය ඇඳ මත තබා දෑස් පියාගෙන මොහොතක් කල්පනා කරයි.

ප්‍රශාදාරත්න ඇමතිවරයාට තමා පිළිබඳ ගතු කේළම් කියන්නේ අයේෂා ය යන සැකය දැන් දැන් ඔහු සිත තුළ දැඩිව මතුව එයි. ඉක්මණින් අයේෂාගෙන් ඈත් විය යුතු යයි ඔහුගේ සිත කියයි. තමා යන්නට බලාපොරොත්තු වන දිග ගමනට බාධාවක් වන කිසිවකු ළඟින් තබා ගත යුතු නැත. ඒ ස්ථාවරයේදී වින්ධ්‍යා සහ අයේෂා අතර වුව වෙනසක් නැත.

කීප වතාවක් නාද වන දුරකතනය නිහඬ වෙයි. රණසිංහ ඇඳෙන් නැගිට ජනේලය වෙත යයි. තානායමේ මිදුලේ නවතා තිබූ වාහන ගණන අඩු වී ඇත. වැස්ස නැවතී ඇති බැවින් බොහෝ අය අටමස්ථාන වන්දනාවේ යන්නට ඇත.

කාමරයට තේ ගෙන්වාගන්නට මුලින් සිතුණද ඔහු පසුව ඒ අදහස ඉවත් කර ගනියි. සවස තුන පමණ වනවිට ඔහු මනාව මදින ලද ඇඳුමකින් සැරසී පහත මාලයට එයි.

"සර් හමුවෙන්න කෙනෙක් ඇවිත් ඉන්නවා.. උදේ ඉඳලා ඉන්නෙ.." පිළිගැනීමේ කවුන්ටරයේ සිටින තරුණිය කියන්නේ බොහෝ යටහත් පහත් ලෙස ය.

"මං මෙහෙ ඉන්නවා කියලා ඒ මනුස්සය දන්නෙ කොහොම ද...?" රණසිංහ සිනා නැති මුහුණින් අසයි.

"දන්නෑ සර්.. එයා සර්ගෙ හිතවතෙක් කිව්ව.. සර්ගෙ සෙකියුරිටි අයත් එයාව දන්නවා මං හිත්නනෙ.. මං දැක්ක කතා කර කර ඉන්නවා... සර්ට ඩිස්ටර්බ් කරන්න බැරි නිසා අපි කතා කළේ නැහැ.."

"විජිත ට කියන්න එයාව එක්ක එන්න කියලා.." රණසිංහ සාලයේ සැප පුටුවේ වාඩි වන අතර කියයි. තේ කෝප්පය අතට ගන්නා රණසිංහ කුඩා මේසය මත ඇති පුවත්පතට ඇස යොමු කරයි. ළඟ ළඟ එන මැතිවරණය ගැන ලියන ලද වැදගැම්මකට නැති වාර්තා අතර ඔහුගේ ඇස දුවන්නේ කියවන්නට වැදගත් යමක් ඇද්දැයි සොයා ගන්නට ය.

"රණසිංහ අයියා.." ඒ කටහඬ හඳුනාගන්නට දෙවරක් කල්පනා කරන්නට ඇවැසි නැත.

"අජිත්...? මෙහෙ මොකද කරන්නෙ..?" රණසිංහ අසන්නේ විමතියෙනි. ඒ අතරේදී ඔහු විජිතට ඉවත්ව යන්නට සන් කරයි.
"..වාඩිවෙන්න මල්ලි.."
තමා ඉදිරියේ වාඩි වන තරුණයා දෙස රණසිංහ විමසුම් ඇසින් බලයි. කටුක රැ කියාව නිසා අව්වට පිළිස්සුණ සිරුරින් යුතු අජිත් ගේ තියුණු දෑස් මත රණසිංහ ගේ දෑස් නවතියි.

"ඇයි මෙහෙ..?"

"අයිය හම්බ වෙන්නමයි ආවෙ.." අජිත් කියන්නේ කිසිවකුට නෑසෙන තරම් පහත් හඬින් ය.

"කොහොමද දන්නෙ මං අද මෙහෙ ඉන්න බව..?"

"දැනගත්ත .." අජිත් කෙටි පිලිතුරක් දෙයි "අනුරාධපුරේ මට යාලුවො ගොඩක් ඉන්නවා.."

රණසිංහ කල්පනාවෙන් බර සිතින් යුතුවම තේ කෝප්පයක් මේසය හරහා අජිත් දෙසට තල්ලු කරයි "..කිරි සීනි ඇති තරම් දාගන්න.."

"එපා අයියෙ.. මං බීලා ආවෙ.."

"කමක් නෑ.. බොන්න.. දවල්ට කාල ද ඉන්නෙ..?" අජිත් අහිනයෙන් ඔව් යයි කියයි. ඔහු තේ උගුරක් බී කෝප්පය මේසය මත තබන තෙක් රණසිංහ නිහඬව බලා සිටියි. ".. ඇයි හදිසියෙම මාව හම්බවෙන්න එන්න හිතුවෙ..?"

"අයිය එදා කිව්ව දේ ගැන මං කල්පනා කළා.. මට ආයෙ යන්න බැහැ.. මං කැමතියි වෙන රස්සාවකට යන්න"

රණසිංහ එකවර යමක් නොකියා කල්පනාවට වැටී සිටියි.

දේශපාලන පොර පිටියේ නීති රීති අනපේක්ෂිත ලෙසින් වෙනස් වෙමින් තිබෙයි. පක්ෂ ගණනාවක් සමග එක්ව සන්ධානය පිහිටුවීම හේතුවෙන් තමන්ගේ අනාගතය අවිනිශ්චිත වෙමින් තිබෙන බව කල් තබා තේරුම් ගැනීමේ අපහසුවක් රණසිංහ ට නැත. අනාගත අවදානම සඳහා කල් ඇතිව සූදානම් විය යුතු ය.

ඔහුගේ සිහියට එන්නේ අයෝමා ය. ඇගෙ " සිතුවිලි පිළිබඳ මනා අවබෝධයක් තමාට ඇතැයි රණසිංහ විශ්වාස කරයි. අජිත් ගේ මේ තීරණයට ඈ කැමති නොවනු ඇති බව නිසැක ය. ඈ කැමති කරවා ගත යුතු ය. අජිත් සිටිය යුත්තේ තමා අසළ බව ඔහු පසක් කරගෙන සිටියි. අනාගතය වෙනුවෙන් කෙරෙන මේ ආයෝජනය අත හැරිය නොහැකි ය.

"නංගිට කිව්වද..?" ඔහු අසයි.

"නෑ.. පස්සෙ කියනවා"

"එයා කැමති වෙන එකක් නෑ"

"අකමැති වෙන්න හේතුවක් නෑ.. මං හමුදාවට ගියේම එයාලගෙ අකැමැත්තෙන්" අජිත් කියන්නේ හිස් තේ කෝප්පය මේසය මත තබන අතර ය. ඔහු ගේ මුහුණ විඩා බර ය. තමා කෙරෙහි තබන විශ්වාසය පිළිබඳ සටහනක් ඔහුගේ දෑසෙහි ලියැවී ඇතැයි රණසිංහ ට සිතෙයි.

"හොඳයි.. හවසට මං එක්කම කොළඹ යං.. "

0000000000

උදෑසන සිටම අයෝමා සිටියේ ඇයට ම තේරුම් ගත නොහැකි නොසන්සුන් කමක් සිත රඳවාගත්වන ම ය. තේරුම් ගත නොහැකි මේ හැඟීම විසින් දවසේ සියලු වැඩ කටයුතු අතපසු කරනු ලබමින් සිටියි.

සුනන්ද නුවර යන බවක් ඇයට කීවේ නැත. තමා යන එන කරන කියන සියල්ල ඈ සමග කීමේ පුරුද්දක් කිසි දිනෙක ඔහුට තිබුණේ ද නැත. එනමුදු වඩා දුර ගමනක් යනවිට පමණක් අවම වශයෙන් දුරකතනයෙන් හෝ ඒ බව කියා යන්නට ඔහු අමතක නොකළේ ය. මේ වතාවේ ඔහු ගිය බව ඇය දැනගත්තේ තිසල් ගෙනි. එය ද අහම්බෙන් ය.

සුනන්ද ත් තමාත් ඉතා වේගයෙන් ඈත්ව යමින් සිටින බව දැන් දැන් ඇයට වඩාත් හොඳින් දැනෙයි. ඔහු තමාගෙන් ඈත් වනවාට වඩා වැඩි වේගයකින් තමා ඔහු වෙතින් ඈත්ව යන බව ඇය දනියි. එසේ තිබියදී ඔහු වින්ධ්‍යා සමගින් නුවර යාම සිය සිත සසළ කරන්නට සමත්වීම පුදුමයක් නොවේ දැයි ඇය සිතයි. එවැනි ගමන් ඔහු මෙයට පෙර ද ඕනෑ තරම් ගොස් තිබුණි. එබැවින් එහි ඇති අරුමයක් ද නැත.

අසාර්ථක දවසක් නිමා කරමින් සිටියදී රණසිංහ වෙතින් දුරකතන ඇමතුමක් ලැබීම ඇගේ සිත සතුටට පත් කරයි.

"ඔයාගෙ වැඩේ කරල දෙන්න ඇමති තුමා පොරොන්දු වුණා.." ඔහු වැල්වටාරමින් තොරව ම මාතෘකාවට පිවිසෙයි. "යාලුවට කියන්න හෙට ඔෆිස් එකෙන් ලියුම ගන්න කියලා.."

"අහන්නත් සතුටු නිව්ස් එකක්.." සතුට සඟවන්නට ඇය නොවෙහෙසෙයි.

"මේ ඔයා මගෙන් ඉල්ලපු එකම ඉල්ලීම.. ඒකත් ඔයා ඉල්ලුවෙ ඔයා වෙනුවෙන් නෙවෙයි.. වෙනින් කෙනෙක් වෙනුවෙන්.."

"මේක මං වෙනුවෙන්ම කළ දෙයක් කියලා මං හිතාගන්නම්.. ඔයාට ස්තුති කරන්න වචන නැහැ මා ළඟ"

"කිසිම දෙයක් ආපහු එපා.. මං මහපාරෙ හිටිය කාලෙ මගේ හෙවණැල්ල වගේ හිටිය ඔයාල වෙනුවෙන් යමක් කරන්න ලැබෙන එක මට සතුටක්.. මං ඔයාලෙගෙ ගෙදරින් බීල තියෙන තේ කෝප්ප ගානටවත් ගැලපෙන උදව්වක් කරන්න මට කවදාවත් ලැබෙන එකක් නැහැ.." ඔහු සුසුමක් හෙළණු ඇයට ඇසෙයි. ".. මට යමක් කරන්න පුලුවන් කාලෙ එනකොට ඔයාල මගෙන් ඈත් වුණා... ඒකයි මට දුක.."

"අපි ඈත් වුණා නෙවෙයි අයියෙ.. ඔයා අපට කිට්ටු කරන්න බැරි මානෙකට ගියා.. එහෙමත් නැත්නම් ඔයා එහෙම ගියා කියලා අපි හිතුවා.. අපට දැනුණා.. සමහර විට අපිට දැනුණ දේ වැරදි වෙන්න ඇති කියලා දැන් මට හිතෙනවා.. ඒත් එදා අපට දැනුණ දේ උඩ තමයි හැම දේම සිද්ද වුණේ.. අපි නැවතිලා බලන් හිටියා.. ඔයා අපට කතා කරයි කියලා අපි බලන් හිටියා.. ඒත් ඔයාට ඒක මතක් වුණේ නැහැ.."

**සුනන්ද ත් තමාත් ඉතා වේගයෙන් ඈත්ව යමින් සිටින බව දැන් දැන් ඇයට වඩාත් හොඳින් දැනෙයි. ඔහු තමාගෙ න් ඈත් වනවාට වඩා වැඩි වේගයකින් තමා ඔහු වෙතින් ඈත්ව යන බව ඇය දනියි. එසේ තිබියදී ඔහු වින්ධ්‍යා සමගින් නුවර යාම සිය සිත සසළ කරන්නට සමත්වීම පුදුමයක් නොවේ දැයි ඇය සිතයි. එවැනි ගමන් ඔහු මෙයට පෙර ද ඕනෑ තරම් ගොස් තිබුණි. එබැවින් එහි ඇති අරුමයක් ද නැත.**

"වැරැද්ද මගේ වෙන්න ඇති.. මම මහා වේගෙකින් ගමනක් ගියා.. මම දැන් මේ එපා කරපු ගමනින් හති වැටිලයි ඉන්නෙ.. අපි වැරැද්ද හදාගන්න බලමු.. ." බලාපොරොත්තු නොවූ මොහොතක දුරකතනය විසන්ධි කරමින් ඔහු පහත් හඬින් කියූ අවසන් වැකිය ඇයට පැහැදිලිව ඇසෙයි ".. ආයෙ මාව දාල යන්න එපා."

ඒ වැකියේ සැඟවගත් අරුතක් ඇතැයි අයෝමාට සිතෙයි. එය පොදුවේ සැමට කියූ කියමනක්ද විය නොහැකි ද? රීඩ් මාවත ඔස්සේ ඇවිද එන අතර ද ඇයට සිහිපත් වන්නේ ඔහු ගේ කතාව ය.

32 වන පිටුවට